# නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මී ඔය
## வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் – மீ ஓய
## Resident Project Management Office – Mee Oya

**වාරිමාර්ග කළමනාකරණ අංශය**
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division
**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය**
கல்கமுவ
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management

මී ඔය
ගල්ගමුව
மீ ஓய
Mee Oya
Galgamuwa


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref No: 018/5/ 2 | ඔබේ අංකය / உமது இல. / Your Ref N: | දිනය / திகதி / Date: 2018 /01 /23 |

ව්‍යාපාර කළමනාකරණ කමිටු සාමාජික සියලුම රජයේ නිලධාරි මහතුන් හා
සියලුම ගොවි සංවිධාන නියෝජිතවරුන් වෙත

<u>ව්‍යාපාර කළමනාකරණ කමිටු වාර්තාව -2018 ජනවාරි මාසය</u>

<u>උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය</u>

මී ඔය - උස්ගල සියඹලන්ගමුව නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ ප්‍රධානත්වයෙන් 2018 – 01 – 23 දින පෙ ව 09.00 ට උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයෙහි දී ව්‍යාපාර කමිටු රැස්වීම ආරම්භ කරන ලද අතර එහිදී පළමුව ආගම සිහි කිරීමෙන් පසු පැමිණ සිටි සියලුම රාජ්‍ය නිලධාරීන් සහ ගොවි නියෝජිතයින් පිළිගැනීමෙන් පසු න්‍යාය පත්‍රානුකූලව එදිනට නියමිත කටයුතු ආරඹන ලදි.

<u>එදින සහභාගී වූවන්ගේ නාම ලේඛනය</u>

| අනු අංකය | නම | ආයතනය / ගොවි සංවිධානය |
|---|---|---|
| 01. | ඩී.එම්.කේ.එච්. දිසානායක | නේවාසික ව්‍යාපාර කළමනාකරු - මී ඔය /උස්ගල |
| 02. | එච්.එම්.කේ.සී.හේරත් | මී ඔය / උස්ගල කාර්යාලය - සං. සහකාර |
| 03. | ආර්.එම්.නිහාල් රත්නායක | කෘෂිකර්ම උපදේශක - උස්ගල සියඹලන්ගමුව |
| 05. | එස්.එච්.ලලිත් නිශ්ශංක | මී ඔය උස්ගල කාර්යාලය - සං. නිලධාරී |
| 06. | ඩබ්.එම්.එල්.ටී. කුමාර | ප්‍රා.වා.ඉං. කාර්යාලය - තාක්ෂණික සහකාර |


නේවාසික ව්‍යා.කළමනාකරු / RPM: 0372253064
ෆැක්ස් / Fax: 0372253064
ඊ මේල් / E-m: rpmmeeoya@gmail.com

| | | |
|---|---|---|
| 07. | කේ.ඒ.චන්ද්‍රපාල | ඩී 01 ගර ලේකම් |
| 08. | බී.එම්.ජයවර්ධන | ඩී 02 ගර සභාපති |
| 09. | ඒ.එච්.ආරියරත්න | ඩී 02 ගර ලේකම් |
| 10. | ඩී.එම්.තිලකරත්න බංඩා | ඩී 02 ගර භාණ්ඩාගාරික |
| 11. | එච්.එම්.සමන්ත හේරත් | ඩී 03 ගර සභාපති |
| 12. | එන්.ජී.අනුර | ඩී 04 ගර සභාපති |
| 13. | ඩී.එම්.සිරිසේන | ඩී 04 ගර භාණ්ඩාගාරික |
| 14. | ආර්.ඩී.ඥාණවංශ | සාලියරාජ - ගර සභාපති |
| 15. | ඒ.පී.ගුණදාස | සාලියරාජ - ගර භාණ්ඩාගාරික |
| 16. | ඩී.එම්.චන්ද්‍රසේකර | යාය 05 - ගර සභාපති |
| 17. | එස්.පී.තිලකරත්න | යාය 05 - ගර ලේකම් |
| 18. | එස්.පී.සුසන්ත සාගර | යාය 05 - ගර භාණ්ඩාගාරික |

<u>පසුගිය කමිටු වාර්තාව සමාලෝචනය හා එකගතාවය ලබා ගැනීම</u>

ඒ අනුව පසුගිය කමිටු වාර්තාවෙහි අඩුපාඩු කිසිවක් ඉදිරිපත් නොවූ නිසා කටයුතු ඉදිරියට සිදු කෙරිණි

<u>01' ආයතන සංවර්ධන කටයුතු - සංවර්ධන සහකාර</u>

<u>01'1' ගිණුම් යථාවත් කිරීම</u>

| ගොවි සංවිධානය | අවසන් වරට ගිණුම් යථාවත් කර ඇති මාසය |
|---|---|
| ඩී 01 | 2017 දෙසැම්බර් |
| ඩී 02 | එම |
| ඩී 03 | එම |
| ඩී 04 | එම |
| යාය 05 | එම |
| සාලියරාජ | එම |

<u>01'2' කාරක සභා මහ සභා රැස්වීම් පැවැත්වීම</u>

රැස්වීම් පැවැත්වීම මේ වන විට වර්ධනය වී ඇති බවක් දැකිය හැක.මෙම තත්වය වර්ධනය කර ගනිමින් ඉදිරියටද පවත්වාගෙන යා යුතුය.ඉදිරි වර්ෂයට අදාල මහ සභා රැස්වීම් පැවැත්වීම ගොවි සංවිධාන විසින් අදාල කාල වකවානු වල ආරම්භ කළ යුතුව ඇති අතර විශේෂයෙන්ම ගොවි සංවිධානයන්හි ඉදිරි කටයුතු සම්බන්ධව සාකච්ඡා කිරීම මූලික කරගෙන මහ සභා රැස්වීම් පැවැත්විය යුතුය.

<u>01'03.පුහුණු වැඩසටහන් - විශේෂ කරුණු නොමැත</u>

<u>01'04'ඉදිරි මාසයේදී පැවැත්වීමට නියමිත නිලවරණ,කාරක සභා,මහ සභා</u>

| කාරණය | ඉලක්කය | වගකීම |
|---|---|---|
| නිලවරණ පැවැත්වීම | - | - |
| මහ සභා පැවැත්වීම | - | - |
| කාරක සභා පැවැත්වීම | 06 | නේවාසික ව්‍යාපාර කළමනාකරු /සංවර්ධන සහකාර/සංවර්ධන නිලධාරී |

**01.05. ගො සං වල ආදායම් වියදම් තත්වයන්.**

පැවති අයහපත් කාලගුණ තත්වය නිසා වගා කටයුතු තිසිවක් සිදු නොවීම මත මේ වන විට ගොවි සංවිධාන සියල්ලේම ආදායම් තත්වය පහළ ගොස් වියදම් ශීර්ශ ඉහළ ගොස් ඇති බව අවසන් ගිනුම් පිරික්සීමේ දී පෙනී යයි.මෙම ගැටලුව නිසා සංවිධානයන්හි අභ්‍යන්තර කටයුතු වලදී ඉතා සැලකිල්ලෙන් හා අරපිරිමැස්මෙන් ගනුදෙනු කටයුතු කළ යුතුව ඇත.එසේ නොවුණහොත් සංවිධාන සියල්ල මූල්‍යමය අතින් ඉතා පහළ තත්වයක් කරා ගමන් කිරීම සිදු වනු ඇත.

**01.06. විගණන කටයුතු.**

ගොවි සංවිධාන වාර්ෂිකව රාජ්‍ය විගණනයට ලක් කිරීම අනිවාර්ය අංගයක් වන බැවින් පෙබරවාරි මාසය වන විට සියලු ගොවි සංවිධාන රාජ්‍ය විගණනයක් කරා යොමු කළ යුතුය.අවසන් ගිණුම් සකස් කිරීම සහ අභ්‍යන්තර විගණනය මේ වන විට සිදු වෙමින් පවතින අතර පෙබරවාරි වන විට රාජ්‍ය විගණනයට අවශ්‍ය සියලු ගිණුම් ලිපි ලේඛන ගොවි සංවිධාන විසින් සකස් කර අවසන් කළ යුතු ය.

**01.07. වෙනත්.**

නඩත්තු ගිණුම් සියල්ල මේ වන විට විවෘත කර අවසන් කර ඇති නිසා මින් ඉදිරියට ගොවි සංවිධාන නඩත්තු කටයුතු වලට අදාලව එම ගිණුම පමණක්ම භාවිතා කරමින් මුදල් යෙදවිය යුතුය.

ගොවි සංවිධාන නඩත්තු අරමුදල්.වාරිමාර්ග ඉංජිනේරු නඩත්තු මුදල් ආදී නඩත්තු සඳහා අදාලව අය වන සියලුම මුදල් මෙම නඩත්තු ගිණුමට බැර කළ යුතුය.යම් කිසි නඩත්තු කටයුත්තක් සඳහා මුදල් අවශ්‍ය වූ විටදී ගොවි සංවිධාන මහ සභාවක අනුමැතියකින් අනතුරුව මෙම මුදල් නිදහස් කිරීමට අවසරය ලැබේ.

යම් කන්නයකදී කිසිදු වගාවක් සිදු නොකරන තත්වයත් මත වුවද ගොවි සංවිධාන විසින් වාරි පද්ධතිය නඩත්තු කිරීම අනිවාර්ය කරුණකි.මේ සඳහා අරමුදල් සපයා ගැනීමට සහ අවශ්‍ය උපකරණ සපයා ගැනීමට ක්‍රමවේද සකස් කළ යුතුය.මෙයට රුකුලක් ලෙස වාරිමාර්ග කළමනාකරණ අංශය මගින් ව්‍යාපාර සඳහා නඩත්තු ඒකකයක් නිර්මාණය කිරීමට කටයුතු කර ඇත.ඒ අනුව ව්‍යාපාර වලට ලැබෙන තණකොළ කපන යන්ත්‍රය උපයෝගී කරගෙන ඉතා පහසුවෙන් හා ක්‍රමානුකූලව වාරි පද්ධතිය නඩත්තු කිරීමට අවස්ථාව ලැබේ.

සාමාජික නාම ලේඛණ නැවත යථාවත් කිරීමට කාලය එළැඹ ඇති බව පෙනී ගොස් ඇති නිසා මෙම කටයුත්ත ද ආරම්භ කළ යුතුය.ඒ මගින් බල ප්‍රෙද්ශයට අදාල කුඹුරු ඉඩම් වල නත්‍ය හා නීත්‍යානුකූල ගොවීන් හදුනා ගැනීමටත් පූර්ණ හා ආශ්‍රිත සාමාජිකයින් ද වෙන් වෙන්ව හදුනා ගැනීමටත් අවස්ථාව ලැබේ.

**01.07. ලිපි ඉදිරිපත් කිරීම.**

වාරිමාර්ග කළමනාකරණ අංශයේ ප්‍රධාන කාර්යාලය මගින් ලිපියකින් දැනුම් දී ඇති පරිදි ගොවි සංවිධාන නිලධාරීන් පළාත් පාලන මැතිවරණය සඳහා තරග කිරීම මහාවාරි ව්‍යාපාර වලට ද අදාලව ඇත.ඒ අනුව ඔවුන් එසේ ඉදිරිපත් වන්නේනම් මෙම කාල සීමාව තුළ තාවකාලිකව අනිවාර්යෙන්ම ගොවි සංවිධාන කටයුතු වලින් බැහැර විය යුතුය.මැතිවරණය අවසන් වූ පසු ඔවුන් ජයග්‍රහණය කළහොත් ගොවි සංවිධානයේ සියලුම කටයුතු වලින් ඔවුන් ඉවත් විය යුතු ය. ජයග්‍රහණය නොකළහොත් පමණක් නැවත ඔවුන්ට ගොවි සංවිධාන කරා නැවත එක් විය හැක.මෙම කාල සීමාව තුළ ඔවුන්ගේ කටයුතු සිදු කිරීම සඳහා එම තනතුරු වලට අදාල උප තනතුරු යෙදවීමට ගොවි සංවිධාන කාරක සභාව කටයුතු කළ යුතුය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් එවා ඇති ලිපියක සඳහන් වන්නේ ඉදිරියේ දී සමස්ථ ශ්‍රී ලංකාව පුරාම වී සහ වෙනත් බෝග සඳහා නව රක්ෂණ ක්‍රමයක් හදුන්වා දෙනු ලැබේ.ඒ අනුව 2017/18 මහ කන්නයේ සිට මෙය ක්‍රියාත්මක වන අතර යම්කිසි ඉඩමක වගාකරුව වෙත මෙම ආවරණය ලැබෙන අතර ප්‍රධාන වශයෙන්ම ගංවතුර.නියගය සහ වන අලි හානි සඳහා මෙය අදාල වනු ඇත. ඊට සාපේක්ෂව අමතර ආවරණ ක්‍රමයක් ලෙස හදිසි ගිණි ගැනීම් .රෝග / පළිබෝධ හානි.කෘමි උවදුරු සහ වෙනත් සතුන්ගෙන් වන හානි යනුවෙන් ද රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ.

වී. බඩ ඉරිගු. අර්තාපල්. ලොකු ලූණු. සෝයා. මිරිස් යන බෝග සඳහා මෙම ආවරණය ලැබේ. ගොවියා විසින් වගාවන් සඳහා රක්ෂණ වාරිකයක් ලෙස රු. 675.00 ක් ගෙවිය යුතු අතර ඊට සමගාමීව රජය විසින් රු.2975.00 ක වෙන් කරනු ලැබේ.වී වගාව උපරිම අක්කර 05 ක් සහ ඉහත කී වෙනත් බෝග අක්කර 02 1/2 ක වගාවක් සඳහා පමණක් මෙය ගෙවනු ලබන අතර වගා හානි සිදුවී දින 14 ක් ඇතුළත හානිදායක තත්වය වාර්තා කළ යුතුය

යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති විමසා සිටියේ මෙම අක්කර ප්‍රමාණය පොහොර සහනාධාරය ලබා ගැනීමේදී ගැටලුවක් ඇති කරන ලබයි.එම නිසා වගා හානි ගෙවන්නේ වී සහ වෙනත් බෝග යන වගාවන් වලින් කුමකටද යන්න නිශ්චිතව වෙන් කර ගොවීන් වෙත දැනුම් දිය යුතු බව පෙන්වා දුණි.

**02. වගා තත්වයන් හා ජල අවශ්‍යතාවය සහ ඉදිරි කන්නය සැලසුම් කිරීම**

**නේ.ව. කළමනාකරු / රාජ්‍ය ආයතන / ගොවි සංවිධාන**

**නේ.ව. කළමනාකරු** - පවතින ජල මට්ටම සහ වර්ෂා තත්වය පාදක කරගෙන අක්කර 01 ක වී වගාවක් බෙත්ම ක්‍රමයට වගා කිරීමට පසුගිය ව්‍යාපාර කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර ඇත.ඒ අනුව එම අදහසට අදාලව ගොවි නායකයින්ගේ අදහස් විමසීමක් මෙවර කරන ලදි.

ඒ අනුව ඇතැම් ගොවි සංවිධාන බෙත්ම වගා ක්‍රමය හදිසියේ ආරම්භ කිරීමට පක්ෂව අදහස් දැක්වුවද ගොවි සංවිධාන කිහිපයක් ඒ සදහා විරුද්ධත්වය පළ කරන ලදි.

ඒ අනුව නේ.ව. කළමනාකරු ඇතුලු සෙසු රාජ්‍ය ආයතන ද එක්ව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉදිරි වර්ෂාවන් සමග මෙම බෙත්ම වගාව ආරම්භ කිරීම සුදුසු බවට ව්‍යාපාර කමිටුවට දැනුම් දුණිගොවි නායකයින් ද පෙන්වා දුන්නේ මේ වන විට වර්ෂාව නොලැබෙන තත්වයක් ප්‍රෙද්ශය පුරා පවතින නිසා වර්ෂාව දෙස අවධානය යොමු කර වගාව සදහා යොමු වීම යෝග්‍ය බවයි.

බල ප්‍රෙද්ශයේ ගොවි සංවිධානයන්හි ගොවීන් මේ වන විට වගා කර ඇති වෙනත් බෝග වගා තොරතුරු කාර්යාලයට අවශ්‍ය වී ඇත.එම නිසා මෙම තොරතුරු හැකි ඉක්මණින් නේ. ව. කළ. කාර්යාලයට ලබා දෙන ලෙස ඉල්ලීය.

**03' වාරිමාර්ග කටයුතු - වැඩ පරිපාලක**

මේ වන විට ජලාශයේ ජල මට්ටම අඩි 10.06 ක් සහ අක්ර අඩි 7920 ක් ලෙස වාර්තා වී ඇත.ඒ අනුව මෙම තත්වය මත වගාවක් සදහා යොමු වන්නේනම් තෝරාගත් ඇළ කිහිපයක බෙත්ම ක්‍රමයට වගා කිරීම පමණක් සුදුසු වනු ඇත.කෙසේ වෙතත් කාලගුණ තත්වය නැවත අයහපත් අතට හැරී ඇති නිසා වර්ෂාව සලකා බලා පමණක් වගාව සදහා යොමු වීම සුදුසු වේ.

1 සියඹලන්ගමුව පෝෂිත ඇළ මේ වන විට දැඩි ලෙස රොන් මඩ පිරී අවහිර වී ඇති අතර ඉදිරි වගා කටයුතු වලට පෙර මෙම බාධක ඉවත් කළ යුතුය.ඒ අනුව වාරි ඉංජිනේරු තුමා ද දැනුම් දී ඇත්තේ මේ සදහා පවතින ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවනු ඇති නිසා ගොවි එක් සංවිධානයකින් රු. 25000.00 ක් බැගින් අරමුදල් යොදවා මෙම කටයුත්ත අවසන් කිරීමට සිදු වනු ඇත.මෙම අදහස ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කළ පසු ගොවි සංවිධාන සියල්ල කැමැත්ත පළ කරන ලදි.

| ගැටලුව ඉදිරිපත් කළ අය | ගැටලුව | විසදුම | වගකීම | කාලය |
|---|---|---|---|---|
| ඩී 04 - සභාපති | දකුණු ප්‍රධාන ඇළෙහි රොන් මඩ නැවත පිරී ඇළ අවහිර වී තිබීම | නැවත එම රොන් මඩ ඉවත් කිරීම | වා.ඉ/ඉ.ස. | අදාල යන්ත්‍ර සූත්‍ර කාර්යාලයට ලැබුණු පසු |
| ඩී 04 - සභාපති | වර්ෂාව නොමැති වීම නිසා පානීය ජල ගැටලුවක් ඇතිව තිබීම | වාරි පද්ධතියට ජල මුරයක් නිකුත් කිරීම | වා.ඉ/ඉ.ස./නේ.ව.ක. | මෙය දින කිහිපයක් ප්‍රමාද කිරීමට සිදු වනු ඇත |
| යාය 05 - සභාපති | පෝෂිත ඇළෙහි රොන් මඩ ඉවත් කිරීමට ඉහත කී අරමුදල් ප්‍රමාණවත් නොවීම | ප්‍රමාණවත් වන ලෙස අරපිරිමැසුම් උපාය මාර්ග යෙදීම | වා.ඉ/ඉ.ස. | අදාල යන්ත්‍ර සූත්‍ර සහ අරමුදල් කාර්යාලයට ලැබුණු පසු |

මීගලෑව සිට දිවෙන උස්ගල සියඹලන්ගමුව පෝෂිත ඇළ යථා තත්වයට පත් කර ගැනීමට මින් පෙර සිට උත්සාහ දරා ඇත.නමුත් මේ සදහා විශාල ලෙස මුදලක් වැය වන නිසා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දීමට කිසිදු ආයතනයක් ඉදිරිපත් නොවී ඇත.මේ නිසා උස්ගල සියඹලන්ගමුව ජලාශයට විශාල ගැටලුවක් ඇතිවී තිබේ.මෙම ගැටලුව සදහා පිළියම් යෙදීමට මෙතැන් පටන් උත්සුක විය යුතු අතර උස්ගල සියඹලන්ගමුව ඒකාබද්ධ ගොවි සංවිධානය විසින් සියලු ගොවි සංවිධාන ඒක රාශී කර අදාල ආයතන දැනුවත් කළ යුතුය.

ඩී 02 ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික සහ ඩී 04 ගොවි සංවිධානයේ ගරු සභාපති නව අදහසක් ඉදිරිපත් කරමින් පෙන්වා දුන්නේ දැනට කිසිදු කාර්යයක් සදහා යොදා නොගන්නා ඩී 04 ගොවි සංවිධාන අගාවත කොටසෙහි ඇති ලී කොළවැව වන රොද නිසා ප්‍රෙද්ශයට වන අලි සංක්‍රමණය වන බවයි.

2 මෙම වන රොද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින නිසා ගොවීන්ටද කිසිදු වගාවක් කිරීමට නීත්‍යානුකූල අවසරයක් නොමැති බව පෙන්වා දුණි.මේ නිසා මෙම ඉඩම් වගා කිරීමට ගොවීන්ට ලබා දෙන ලෙස හෝ ඒ වෙනුවෙන් වන අලි වැටක් ඉදි කර දෙන ලෙස රාජ්‍ය ආයකන වලට දන්වන ලෙසට කමිටුවට දැනුම් දුණි.

ඩී 02 ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික වැඩි දුරටත් ප්‍රකාශ කළේ උස්ගල සියඹලන්ගමුව ජලාශයේ සිට ඩී 04 ගොවි සංවිධානය දක්වා ඇති සියලුම වනාන්තර පෙදෙස් ගොවීන්ට වගා කිරීමට දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් හරහා ඉල්ලීම් කර අවස්ථාව ලබා ගත හැකි නම් එය ද මහත් අස්වැසිල්ලක් වන බවයි.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වන මෙම වනාන්තර ගොවීන්ට නිදහස් කර දීම ඉතා අසීරු ක්‍රියාදාමයක් බව ප්‍රකාශ කරමින් මේ සියලු කරුණු අවධාරණයට ලක් කර නේවාසික ව්‍යාපෘති කළමනාකරු ප්‍රකාශ කළේ මෙම කරුණු සියල්ල සැකෙවින් ඉතා පැහැදිලිව ගරු අමාත්‍යවරුන් සහ රේඛීය රාජ්‍ය නිලධාරීන් වෙත දැනුම් දීමට ඒකාබද්ධ ගොවි සංවිධානය මගින් ලිපි සකස් කළ යුතු බවයි.

## 04' කෘෂිකර්ම කටයුතු - කෘෂිකර්ම උපදේශක

පසුගිය කාල වකවානුවේදී ගොවීන්ට බෙදා දුන් මුං බීජ මේ වන විට ජල හිග තාවය නිසා වගා කිරීමට නොහැකි තත්වයට පත්ව ඇත.ඒ අනුව සීමිත ගොවීන් කිහිප දෙනෙකුගේ හැර බොහෝ දෙනෙකුගේ මුං වගාවන් විනාශ වී ඇති බවට පරීක්ෂණ වලින් හෙළි වුණි.ඒ අනුව ඉතිරි වූ මුං බීජ නැවත අදාල ආයතන වෙතටම භාර දීමට කටයුතු කරන ලදි.

පසුගිය කමිටුවේදී කළ ඉල්ලීමට අනුව ගොවි සංවිධාන මට්ටමින් ගොවි පවුල් තොරතුරු මේ වන විට ගොවි නායකයින් විසින් අප වෙත ලබා දී ඇත.ඒ අනුව උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරයේ ගොවි සංවිධානයන්ට අදාල ගොවි පවුල් විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | ගොවි සංවිධානය | ගොවි පවුල් ගණන |
|---|---|---|
| 01 | ඩී 01 | 610 |
| 02 | ඩී 02 | 325 |
| 03 | ඩී 03 | 185 |
| 04 | ඩී 04 | 192 |
| 05 | සාලියරාජ | 439 |
| 06 | යාය 05 | 430 |
| | එකතුව | **2181** |

මේ දිනවල පවතින අයහපත් කාලගුණ තත්වය මත වුවද ගොවීන් විසින් යම් යම් ප්‍රමාණ වලින් වෙනත් බෝග වගාවන් කර ඇත.මෙම වගාවන් වලට ප්‍රමාණවත් ජලය නොලැබීම සහ දැඩි හිරු රශ්මිය පතිත වීම නිසා අස්වනු අඩු විය හැක.මේ නිසා නිවැරදි බෝග වගා උපදෙස් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිරන්තරයෙන් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

එසේම වගාවන් සඳහා වල් නාශක හා කෘමි නාශක යෙදීමේ දී ඉතා නිවැරදි හා යෝග්‍ය ඒවා යෙදීමට ගොවීන් කටයුතු කළ යුතු අතර ම එම වල් නාශක . කෘමි නාශක හා පළිබෝධ නාශක නීත්‍යානුකූල බලපත්‍ර හිමි වෙළඳසැල් වලින් පමණක් ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය.

## 05'සැපයුම් හා සේවා - ගොවිජන සේවා මධ්‍යස්ථානය

මේ සම්බන්ධව ද අදහස් දැක්වීමට ගොං සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් නිලධාරියෙකු පැමිණ සිටියේ නැත.

## 07'වෙනත් - ගොවි සංවිධාන

යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති - ගොවීන්ගේ යම් වගාවක් කාලයත් සමග හානියට ලක් වූ පසු ඒ සඳහා වන්දි මුදල් පිරිනැමීමක් මේ වන විට රජය විසින් ක්‍රියාත්මක කරගෙන යයි.මෙම වගා හානිය තක්සේරු කිරීමේ පළමු නිලධාරියා වන්නේ වසමට අදාල කෘ.ප.නි.ස. නිලධාරියා ය.නමුත් මෙම තක්සේරුව ඉතා නිවැරදි හා සාධාරණ එකක් ද යන ගැටලුව අවස්ථා කිහිපයක දී පැණ නැගුන එකකි.එම නිසා මේ පිළිබඳව ඔවුන් ඉදිරියේදී දැනුවත් කළ යුතුය.

යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති සහ එහි ගරු ලේකම් විසින් විමසා සිටියේ උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරයට අදාල නීත්‍යානුකූල කුඹුරු වලට අමතරව වෙනත් ක්‍රම මගින් ද ඉඩම් සකස් කර වගාවන් කරගෙන යන බවයි.

මෙම කුඹුරු සඳහා ජලය වාරි පද්ධතිය හරහා උස්ගල ජලාශයෙන් ලබා ගන්නා සේම පොහොර සහනාධාරයද දැනට රජය හරහා ලබා ගන්නා බව දැනුම් දුණි.මෙම කුඹුරු වලින් බහුතරයක් සඳහා දැනට ඔප්පු සහ බලපත්‍රද පවතින බව වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි.

නේවාසික ව්‍යාපෘති කළමනාකරු පෙන්වා දුන්නේ ඉඩම් වල ස්වභාවය කෙසේ වෙතත් ඔවුන්ට ගොවි සංවිධාන වලට ඇතුළත් වී සාමාජික වීමට ඉහත සාධක අති ප්‍රමාණවත් බවයි.

ඒ අනුව කුඹුරේ නීත්‍යානුකූල භාවය. වගා කරු. දැනට අයිතිකරු . පසු උරුමයන් ආදී සියල්ල සොයා බලා ඔවුන්ට සාමාජිකත්වය දීම හෝ නොදීම ඉක්මණින් කළ යුතු බව වැඩි දුරටත් පෙන්වා දුණි.

අද දින රැස්වීමේදී ගනු ලැබූ තීරණ අනුව පමණක් ඉදිරියේදී වී වගාව සඳහා ජලය නිකුත් කිරීමට කටයුතු කළ හැකි වන අතරම කාලගුණ තත්වය සලකා බලා දිස්ත්‍රික් ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් වගා රැස්වීම පැවැත්වීමට කටයුතු යොදනු ලැබේ.

PIESEP වැඩසටහන ඉදිරියේදී ආරම්භ කිරීමට සියලු කටයුතු මේ වන විට යොදා ඇති නමුත් මෙම වැඩසටහන වෙනත් ව්‍යාපාරයකට අනුයුක්ත කිරීමට ඉඩ කඩ ඇති බවට තොරතුරු ලැබී ඇත. PIESEP වැඩසටහන සඳහා උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය මුල සිටම ඇතුළත් කර තිබූ අතර මෙම කණගාටුදායී තත්වය ගොවීන්ට සහ වාරි පද්ධතියටද මහත් පාඩුවක් වනු ඇත.මේ නිසා මෙම ව්‍යාපෘතිය උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය සඳහා ලබා දෙන ලෙස ලිපි මගින් ඉල්ලීම් කරන ලෙස උස්ගල සියඹලන්ගමුව ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති තුමාට උපදෙස් දුණි.

කෙසේ වෙතත් ඉදිරි වගා කටයුතු සඳහා ගොවීන් විසින් ඇල වේලි පද්ධතිය නඩත්තු කිරීම කළ ආරම්භ කළ යුතුය.එසේ වුවහොත් ජලාශයට ජලය ලැබෙන තත්වයක් පැවතුණ විටකදී ගොවීන්ට වගාව ආරම්භ කිරීම ඉතා පහසු වනු ඇති බව දැනුම් දුන් අතර ඉදිරි කාලගුණ තත්වය අනුව වැසි ලැබෙන ආකාරය දෙස අවධානය යොමු කර ඉදිරියේ දී කන්නය පිළිබඳව තීරණයක් ගැනීමට කටයුතු කරන බව ද වැඩි දුරටත් දන්වමින් මෙම ව්‍යාපාර කමිටු රැස්වීම සඳහා සහභාගී වූ සියලුම රාජ්‍ය අංශයේ නිලධාරීන්ටත් ගොවි නායක මහත්ම මහත්මීන්ටත් ස්තුතිය පුද කරමින් ප.ව. 12.00 ට පමණ කමිටුව අවසන් කරන ලදි.

ඩී.එම්.කේ.එච්. දිසානායක

නේවාසික ව්‍යාපාර කළමනාකරු

මී ඔය / උස්ගල සියඹලනගමුව ව්‍යාපාරය

ගල්ගමුව

පිටපත්-

01'අධ්‍යක්ෂ.වාරිමාර්ග කළමනාකරණ අංශය.කොළඹ (-කා.දැ.ස

02'දිස්ත්‍රික් ලේකම්.කුරුණෑගල (-කා.දැ.ස

03'ගොවිජන සං.නියෝජ්‍ය කොම.කුරුණෑගල (-අ.ක.ස.

04'කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ.කුරුණෑගල (-කා.දැ.ස

05'ප්‍රාද්ශිය ලේකම්.ගල්ගමුව (-අ.ක.ස.

06'සහකාර කෘසිකර්ම අධ්‍යක්ෂ.අ/පුර.අන්තර් පළාත් (-අ.ක.ස.

07'වාරිමාර්ග ඉංජිනේරු.ගල්ගමුව (-අ.ක.ස.

08' සහකාර කෘසිකර්ම අධ්‍යක්ෂ.ප්‍රා.ලේ.කාර්යාලය.ගල්ගමුව (-අ.ක.ස.

09'ගොවිජන සංවර්ධන නිලධාරී.ගල්ගමුව (-අ.ක.ස.

10'කෘෂිකර්ම උපදේශක.උස්ගල සියඹලන්ගමුව (-අ.ක.ස.